# SME - ණය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ මාර්ගෝපදේශයන්ට අනුකූලව, SDB බැංකුව විසින් ඔබට අවශ්‍ය සහ සුදුසු බැංකු නිෂ්පාදන සහ සේවාවන් තෝරා ගැනීමට ඔබට සහය වීම සඳහා ප්‍රධාන කරුණු ලේඛන මාලාවක් (KFDs) සකස් කර ඇත. මෙම KFD මගින් පුද්ගලික බැංකුකරණය සඳහා පවතින ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ ඇතුළුව විවිධ වර්ගයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පිළිබඳ සාමාන්‍ය දළ විස්තරයක් ගෙනහැර දක්වයි. කෙසේ නමුත් මෙම KFD හි සපයා ඇති තොරතුරු නීතිමය සහ නියාමන වෙනස්කම්වලට මෙන්ම මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් යාවත්කාලීන කිරීම සිදුවිය හැකි බව කරුණාවෙන් සලකන්න. ඔබට වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය නම් කරුණාකර 011 5 411 411 යන අපගේ පැය 24 ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය හරහා හෝ www.sdb.lk වෙබ් අඩවිය ඔස්සේ අප සමග සම්බන්ධ වන්න. ඔබට ඔබගේ ගිණුම් සම්බන්ධයෙන් යම් ආකාරයක පැමිණිල්ලක් සිදුකිරීමට අවශ්‍ය නම්, කරුණාකර පැමිණිල්ලෙ විස්තර සහිත කෙටි ප්‍රකාශයක් SDB බැංකු පීඑල්සී, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06 හි ඇති පැමිණිලි විසඳීමේ නිළධාරී වෙත යොමු කරන්න. නැතිනම් [+94(0) 11 5 411 411] දුරකථනයෙන් හෝ [customercare@sdb.lk] විද්‍යුත් තැපෑලෙන් අප සමග සම්බන්ධ වන්න. එවිට අප ඔබට ඉතා ඉක්මනින් ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුම පිළිබඳ විස්තරය | ණයගැනුම්කරුවන්ට හිමිවෙන ප්‍රතිලාභ | පොලී අනුපාත වර්ගය | අනුපාත සංශෝධන වාර ගණන | ගාස්තු වර්ග සහ අනිකුත් බැංකු අයකිරීම් | ගිණුමක් ආරම්භ කිරීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය (සුදුසුකම්/අවශ්‍ය ලියවිලි/ අයදුම්කරන ආකාරය) | ප්‍රධාන නීතිරීති සහ කොන්දේසි |
|---|---|---|---|---|---|---|
| 1. SME කාරක ප්‍රාග්ධන සහ ප්‍රාග්ධන වියදම් ණය මෙමගින් අදහස් වේ. | කෘෂිකාර්මික සේවා, කර්මාන්ත සහ නිෂ්පාදන යන ප්‍රධාන අංශ වල (GDP) අංශවල නිරත වන ව්‍යවසායකයින්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ ප්‍රාග්ධන වියදම් සපුරා ගැනීමට මෙමගින් ණය පහසුකම් ලබා දේ. | * බැංකුව සතු මුදල් නම් (sheet rates)<br>* පවතින ප්‍රතිමූල්‍යකරණ යෝජනවා සහ<br>* ස්ථාවර සහ පාවෙන යන දෙකම අදාළ වේ.<br>(AWPLR සහ අභ්‍යන්තර අනුපාතික අදාළ වන අතර අභ්‍යන්තර අනුපාතිකයේ මිණුම් දර්ශකය බැංකුවේ වෙබ් අඩවිය මගින් ජනතාවට දැනගැනීමට හැකි වේ.) | AWPLR වලට යටත්ව මුදල් සඳහා භාවිත ණය රේඛා මත පදනම්ව, CBSL ප්‍රකාශයට පත් කරන ලද ගාස්තු වෙනස් විය හැක. | * ලේඛනගත කිරීම<br>* පරීක්ෂා කිරීම<br>* CRIB<br>* ණය සමාලෝචනය/<br>* හැකි සෑම විටම හිමිකම්, උකස් බැඳුම්කර සහ අනිකුත් නීතිමය ගාස්තු<br>* රක්ෂණ ගාස්තු (බැංකු ගාස්තු පිළිබඳ අදාළ වන සාමාන්‍ය චක්‍ර ලේඛනය, ගාස්තු තීරණය කිරීමේ පදනම වේ.)<br>* වැඩි විස්තර දැනගැනීමට වෙබ් පිටුවේ දැක්වෙන ගාස්තු සහ අයකිරීම් වන ලිපිය කියවන්න. | * ණයගැනුම්කරුගේ අයදුම් පතේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම.<br>* ව්‍යාපෘතිය හෝ අරමුණට අදාළ සියලු ලියවිලි ගනුදෙනුකරු විසින් බැංකුවට ලබාදීම අවශ්‍ය වේ.<br>* BM හෝ වගකිය යුතු අය විසින් ස්ථාන පරීක්ෂාවක් සිදුකර සතත්‍යාව තහවුරු කරගැනීම.<br>* බැංකුව විසින් ණයගැනුම්කරුගේ වර්තමාන සහ අනාගත මූල්‍ය හැසිරීම පිළිබඳ නිසි මූල්‍ය විශ්ලේෂණයක් සිදු කෙරේ.<br>* බැංකු ශාඛාව විසින් ව්‍යාපෘතිය උඩුගත (Upload) කෙරේ.<br>* CCD ඇගයීම<br>* අවදානම පිළිබඳ ඇගයීම (අවශ්‍ය නම්)<br>* අනුමැතිය<br>* CAU ක්‍රියාවලිය<br>* ණය ලබාදීම | * කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව නිෂ්පාදන-යේ නිරත සෑම ණය ණයගැනුම්කරුවෙකුටම U pay සහ Debit කාඩ්පත් හඳුන්වාදීම අනිවාර්ය කරුණකි.<br>* හැකි සෑම විටම ව්‍යාපාර, ණයගැනුම්කරුවන්ට හඳුන්වා දීම සිදු කෙරේ.<br>* ව්‍යාපෘතියේ ස්වරූපය හෝ පහසුකම් මත සුරැකුම්පත් සහ වෙනත් විශේෂ කොන්දේසි අදාළ වේ.<br>* ණය අයදුම්පත ලියාපදිංචි කරන අවස්ථාවේදී E අත්සන යොදා දිවුරුම් ප්‍රකාශය ලබාගැනීම සිදු කෙරේ. |
| 2. කාරක ප්‍රාග්ධන වියදම් පමණක සළකා බැලෙන අතර ආවර්ත ස්ථාවර පොලී අනුපාත පමණක් අදාළ වේ. | | | | | | |
| 3. යම් කාල සීමාවකට | යම් කාල සීමාවකට අනුව කෘෂිකාර්මික සම කෘෂිකාර්මික නොවන අංශයන්හි කෙටි කාලීන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මූල්‍ය පහසුකම් ලබා දේ. | | | | | * සෑම ගිණුම් හිමියෙකුටම U pay සහ Debit කාඩ්පත් හඳුන්වාදීම අනිවාර්ය කරුණකි.<br>* හැකි සෑම විටම ව්‍යාපාර, ණයගැනුම්කරුවන්ට හඳුන්වා දීම සිදු කෙරේ.<br>* වගා කිරීම සඳහා ණය - වගා කිරීමට නියමිත ඉඩම ගනුදෙනුකරු සතු වීමට කැමැත්තක් දැක්වීම. වගා කිරීමට නියමිත ඉඩමේ අයිතිය ණයගැනුම්කරු සතු නොවීම නිසා සහ ඉඩමේ හිමිකරුගේ කැමැත්ත ඔප්පුවක් හෝ බදු ගිවිසුමක් මගින් ඉදිරිපත් කළ නොහැකි නම්,<br>• රු. මිලියන 1ක් දක්වා - එකම ඉඩමේ පසුගිය වසර 3 තුළ වගා කළ බව, ප්‍රදේශයේ GS සහ AI මගින් තහවුරු කිරීම ඉදිරිපත් කළ යුතුය.<br>• රු. මිලියන 2ක් දක්වා - එකම ඉඩමේ පසුගිය වසර 5 තුළ වගා කළ බව, ප්‍රදේශයේ GS සහ AI මගින් තහවුරු කිරීම ඉදිරිපත් කළ යුතුය.<br>* සියලුම කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා - AI මගින් සහතිකය දිරියක් වනු ඇත.<br>* ආපසු ගෙවීමට අදාළ නීතිරීති, ආපසු ගෙවීමේ කාලසීමාව, ඉල්ලුම් කරන මුදල, බෙදාහැරීමේ නීතිරීති සහ භෝගය, භෝග ප්‍රබේදය, භෝග පරතරය යනාදිය මත ව්‍යාපෘතියෙන් උපයන ආදායම රඳා පවතී.<br>* ණය අයදුම්පත ලියාපදිංචි කරන අවස්ථාවේදී E අත්සන යොදා දිවුරුම් ප්‍රකාශය ලබාගැනීම සිදු කෙරේ. |

SDB බැංකුව

#ඔබවවටින

සණස සංවර්ධන බැංකුව පීඑල්සී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණයට ලක් කරනු ලබන බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. Fitch Rating BB+ [lka] , Reg. No: PB62PQ